# ප්‍රාදේශීය ආර්ථික කටයුතුවල කාලීන වෙනස්වීම: කජුගම ග්‍රාමයේ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යනයක්

**බී.ඒ.යූ. නිමලවීර සහ එස්.ආර්.එල්.එස්. රත්නසේකර [1]**

කවර ආර්ථික කටයුත්තක් වුවද නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳව යම් ප්‍රාදේශීය විශේෂීකරණයකට ලක්ව පවතී නම් එම ප්‍රදේශය ප්‍රාදේශීය ආර්ථිකයක් වශයෙන් හඳුනාගත හැකිය. එක් එක් ප්‍රදේශවල භූගෝලීය සාධක, ඓතිහාසික හේතු, සාම්ප්‍රදායික තත්වයන්, රාජ්‍ය ප්‍රතිපත්ති ආදීන් නිසා ප්‍රාදේශීය වශයෙන් එම ආර්ථික කටයුතුවල සුවිශේෂත්වයක් පෙනේ. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථිකයන් වැඩි ප්‍රමාණයක් හඳුනාගත හැක්කේ කෘෂි කාර්මික කටයුතු ආශ්‍රයෙනි. 'කජුගම' කජු අලෙවිය සම්බන්ධ ප්‍රාදේශිය ආර්ථිකයක් වන අතර එය දිගු ඉතිහාසයක් සහිත ප්‍රාදේශීය ආර්ථිකයකි. වර්තමානය වන විට වෙළදාම පිළිබඳ විවිධ වෙනස්කම් කජුගම ප්‍රදේශය ආශ්‍රිතව දැකගත හැකිය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ එම වෙනස්කම් හඳුනාගැනීම සහ ඊට බලපා ඇති ආර්ථික සාමාජීය හේතු සාධක විමසා බැලීමයි.

මේ සඳහා කජුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තෝරාගන්නා ලද අතර ඊට සසම්භාවී නොවන නියැදි ක්‍රම යටතට අයත් ලොතරැයි ක්‍රමය ඔස්සේ වෙළඳපළ කොටස් හඳුනාගෙන (50 දෙනෙකු) එම කොටස් වෙත ප්‍රශ්නමාලාව ඉදිරිපත් කරන ලදී. ප්‍රාථමික දත්ත රැස්කිරීමේදී ප්‍රශ්නමාලා ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලද අතර ද්විතීයික දත්ත රැස්කිරීමක් ද සිදුකෙරිණි.

මෙම අධ්‍යයනයෙන් නිගමන කිහිපයකට එළඹීමට හැකි විය. එනම්, මෑතකාලීනව කජුගම ප්‍රදේශය ආශ්‍රිත කජු වෙළෙදපළෙහි විශාල වෙනස්කමක් හඳුනාගත හැකිවීම මූලික ලක්ෂණයකි. මෙම ප්‍රදේශයේ කජු කර්මාන්තයේ නියැලෙන පිරිස විශාල වශයෙන් අඩුවීමක් දක්නට ලැබෙන අතර වෙනත් කර්මාන්ත කරා ආකර්ෂණය වීම පැහැදිලිව දක්නට හැකි ලක්ෂණයකි.

[1] භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය
ඊමේල් : sujanirathnasekara@yahoo.com

ප්‍රවාහන වියදම ආර්ථිකය කෙරෙහි විශාල බලපෑමක් කර තිබේ. කජු නිෂ්පාදන කජුගමට රැගෙන එන්නේ උතුරු මැද පළාතෙනි. එම නිසා නිෂ්පාදන ප්‍රවාහනය සේම අලෙවි ආදායම පිළිබඳ විවිධ ගැටලු මතු වී තිබේ. කජුගම ග්‍රාමයෙහි කජු පිළිබඳ පවතින ආකල්පමය විශේෂත්වය තව දුරටත් සාමාන්‍ය ජනතාව තුළ නොනැසී පැවතිය ද නිෂ්පාදනහල් ආශ්‍රිතව කජුවලට සාපේක්ෂව වෙනත් ද්‍රව්‍ය අලෙවි කිරීම විශාල වශයෙන් දැකගත හැකිවීම කජුගම ප්‍රාදේශීය ආර්ථිකයේ පැහැදිලි වෙනසකි.

එක් නිෂ්පාදනයක් ඇසුරින් ගොඩනැගෙන විශේෂිත වූ ආර්ථිකයන්හි කාලීන වෙනස්වීම් සිදුවෙමින් පවතී. ඒ වටා පවතින සමාජ ආර්ථික පසුබිම තුළ අනාගතයේ එවැනි ආර්ථිකයක නිෂ්පාදන භාණ්ඩ හා අලෙවිය පිළිබඳ වෙනත් තත්වයක් ගොඩනැගෙනු ඇත. එනම් දැනට පවතින ප්‍රාදේශීය ආර්ථිකයන් අනාගතයේ සාමාන්‍ය වෙළෙඳපළක් බවට පත්වනු ඇත.

**ප්‍රමුඛ පද:** ප්‍රාදේශීය ආර්ථිකය, කජුගම, කජු වෙළෙඳපළ
**Title:** The changes in a regional economy: the case of Kajugama
**Keywords:** Regional economy, Kajugama, cashew market